# 3 ශ්‍රේණිය සිංහල 2022

## ගුරු අත් පොතට වැඩ පොත අංක 06

**L3, S3, R3, W3 නිපුණතා ආවරණය**



- කැමැත්තෙන් හා රස විඳිමින් සවන් දෙයි.
- කැමැත්තෙන් හා රස විඳිමින් කතා කරයි.
- කැමැත්තෙන් හා රස විඳිමින් කියවයි.
- කැමැත්තෙන් හා රස විඳිමින් ලියයි/අඳියි.

සැකසුම – හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 3 ශ්‍රේණිය මව්බස (සිංහල)
# $L_3$ $S_3$ $R_3$ $W_3$ ඉගෙනුම් පල

- කැමැත්තෙන් හා රස විඳිමින් සවන් දෙයි.
- කැමැත්තෙන් හා රස විඳිමින් කතා කරයි.
- කැමැත්තෙන් හා රස විඳිමින් කියවයි.
- කැමැත්තෙන් හා රස විඳිමින් ලියයි/අඳියි

## ළමා කවි/ගීත.

- පහත සඳහන් ගීතය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

### මගේ රට

පුංචි අපට සිරි සැප දෙයි
සිරි ලංකා දීපේ
පාන්දර ම එහෙන් මෙහෙන්
ඇසෙයි කුරුලු ගීතේ
ඕලු නෙළුම් පිපී වැනෙයි
පිරිලා වැව් ගානේ
ඇළ දොළ ගං ඉවුරු දිගේ
වන මල් පෙති පාවේ
සුදු වැල්ලේ කවඩි උඩින්
රළ පෙරළෙයි මූදේ
උසට උසේ කඳු ද පෙනේ
වලාකුළු ද ගෑවේ
පිපෙන සමන් පිච්ච පොකුරු
නැළවෙයි හඳපානේ
ඉර එළියට හඳ එළියට
වෙලේ ගොයම් නෑවේ
වනන්තරේ ගස් බිල්වල
මී පැණි බිඳු බේරේ
හරි සුවඳයි පැසෙයි ඉදෙයි
පලතුරු හැම වාරේ
පුංචි අපට සිරි සැප දෙයි
සිරි ලංකා දීපේ

**ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ**

1. පාන්දර ම ඇසෙන්නේ මොනවා ද ?

.................................................................................................................................

2. ඇළ දොළ ගංගාවල පාවෙන්නේ මොනවා ද ?

.................................................................................................................................

3. වලාකුළු ගෑවෙන්නේ කොහේ ද ?

.................................................................................................................................

4. හඳපානේ නැළවෙන්නේ මොනවා ද ?

.................................................................................................................................

5. මෙම ගීතයෙන් කියවෙන්නේ කුමක් පිළිබඳ ව ද ?

.................................................................................................................................

6. ගීතය කියවා හිස්තැන් සම්පූර්ණ කරන්න.

- ඕලු නෙළුම් පිපී වැනෙයි ..............................................................................
- උසට උසේ කඳු ද පෙනේ ..............................................................................
- පිපෙන ............................................................ පොකුරු නැළවෙයි හඳපානේ
- වනන්තරේ ගස් බිල්වල ..............................................................................
- පුංචි අපට සිරි සැප දෙයි ..............................................................................

- A 4 කොළයක් සහ පාට පෙට්ටියක් බැගින් සිසුන්ට ලබා දෙන්න. මගේ රට ගීතය ඇසුරින් චිත්‍රයක් ඇඳීමට උපදෙස් දෙන්න. තමා අඳින ලද චිත්‍රයට ගැළපෙන වාක්‍ය තුනක් අභ්‍යාස පොත්වල ලිවීමට සලස්වන්න.

**<u>කතන්දර.</u>**

- කියවීම් පොතේ ඇතුළත් නොගැළපෙන රෝද කතන්දරය කියවා වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

**නොගැළපෙන රෝද**

මැස්සෙකුයි, ගෙම්බෙකුයි, ඉත්තෑවෙකුයි, කුකුළෙකුයි ගස් කොටයක් උඩ ගෙයක් හදාගෙන උන්නා. මැස්සගෙ නම රුංරුං පැංචා. ගෙම්බගෙ නම බක බක අප්පුහාමි. ඉත්තෑවගෙ නම ඉඳිකටු මුදියන්සෙ. කුකුළාගෙ නම හඬලන රාල.

දවසක් දා මේ හතර දෙනා කැලෑවක් මැදින් ගමනක් ගියා. හතු, මල්, ගෙඩි ජාති, දර එකතු කරන්න. රුං රුං පැංචා යාළුවො තුන් දෙනාගෙ ඔළු උඩින් පියාසර කෙරුවා.

ඉතින් ඔහොම ගිහින්, ගිහින් මේ හතර දෙනා ම ගස් කොළන් නැති පාළු පිට්ටනියකට ආවා. එතන පුංචි කරත්තයක් තිබෙනවා දැක්කා. කරත්තෙට සවි කරල තිබුණෙ එකට එක නොගැළපෙන රෝද. පළමුවැනි රෝදෙ බොහොම කුඩා එකක්. දෙවැනි රෝදෙ තරමක් ලොකු යි. තුන්වැනි රෝදෙ ඊට ලොකු යි. හතරවැනි රෝදෙ මහ විශාල යි.

යාළුවො පුදුම වෙලා කරත්තෙ දිහා බලාගෙන ඉන්නකොට, ළඟ තිබුණ පඳුරකින් හාවෙක් එළියට පැන්නා. එයත් කරත්තෙ දිහා බලලා හිනා වෙනවා. හාවාගෙ නම පිනුම් හාමි.

''මේ කරත්තෙ ඔයාගෙ ද?'' කියල යාළුවො හතර දෙනා පිනුම් හාමිගෙන් ඇහුවා.''නෑ. ඒක වලස් හාමිගෙ කරත්තෙ. වලස් හාමි ඔය කරත්තෙ හදන්න බොහොම මහන්සි ගත්තා. ඒත් එයාට ඒක හදල ඉවර කරන්ට බැරි වුණා'' කියල පිනුම් හාමි කිවුවා.

''මේ කරත්තෙන් වැඩක් ගන්ට පුළුවන්. ඒ හින්ද අපි මේක ගෙදර ගෙනියමු'' කියලා ඉත්තෑහාමි කිවුවා. ''හොඳයි, හොඳයි'' කියලා ඒ අදහසට අනිත් යාළුවො තුන් දෙනා ම කැමති වුණා. ඒ හතර දෙනා ම එකතු වෙලා කරත්තෙ තල්ලු කරන්න පටන් ගත්තා. රෝද එකට එක ගැළපෙන්නෙ නැති හින්ද කරත්තෙ පොඩ්ඩක් වත් හෙල්ලුණෙ' නෑ. තල්ලු කළාට මොකද පාර පුරා ගස් මුල්වල හැපිලා කරත්තෙ ඒ අත මේ අත පෙරළුණා මිසක් ඉදිරියට ගියේ නෑ.

අහකට වෙලා බලාගෙන හිටිය පිනුම් හාමි හති වැටෙන තුරු හිනා වුණා. කරත්තෙ තල්ලු කරපු යාළුවො හතර දෙනාට හොඳට ම මහන්සියි. ''අපි එක එක්කෙනා එක එක රෝදය ගෙදර ගෙනියමු'' කියලා ඉඳිකටු මුදියන්සෙ කිවුවා.

හතර දෙනා ම ඒකට කැමති වෙලා එක එක රෝදය ගත්තා. රුංරුං පැංචා ඉතා ම කුඩා රෝදය පෙරළන්ට පටන් ගත්තා. ඉඳිකටු මුදියන්සෙ ඊළඟ රෝදය පෙරළන්න පටන් ගත්තා. බක බක අප්පුහාමි තරමක් විශාල රෝදය පෙරලන්න පටන් ගත්තා. හඬලන රාල විශාල රෝදය පෙරළා ගෙන ගෙදර ගියා.

''මේ ගොල්ලො හරි පුදුම මිනිස්සු. එකට එක ගැළපෙන්නෙ නැති රෝද ගෙදර ගෙනියනවා'' කියලා පිනුම් හාමි කිවුවා. ඊට පස්සෙ පිනුම් හාමි පඳුරු අස්සට පැනලා ගියා.

රුංරුං පැංචයි, ඉඳිකටු මුදියන්සෙයි, බක බක අප්පුහාමියි, හඬලන රාලයි රෝද හතර ගෙදර ගෙනාවා. රෝදවලින් වැඩක් ගන්නේ කොහොම දැයි කියලා හතර දෙනා ම කල්පනා කරන්න පටන් ගත්තා.

''මම දන්නවා වැඩක් ගන්න හැටි'' කියලා රුංරුං පැංචා කිවුවා. එයා ඉතා ම කුඩා රෝදයෙන් නූල් කටින යන්තරයක් හදා ගත්තා. ඉදිකටු මුදියන්සෙ එයා ගෙනා රෝදයට ලී පටි දෙකක් සවි කරගෙන තනි රෝදෙ අත් කරත්තයක් හදා ගත්තා.

''මටත් පුළුවනි මගේ රෝදයෙන් වැඩක් ගන්න'' කියලා බක බක අප්පුහාමි කිවුවා. රෝදය ළිඳට උඩින් සවි කරලා බක බක අප්පුහාමි ලෙහෙසියෙන් වතුර අදින්න පටන් ගත්තා.

වේගයෙන් ගලා යන දිය පාරකට අහු වෙලා කැරකැවෙන්න රෝදය සවි කර ගත්තු හඬලන රාලට පුළුවන් වුණා ජල බලයෙන් වැඩ කරන මෝලක් හදා ගන්ට.

මේ විදියට සියලු ම රෝදවලින් වැඩ ගන්න පුළුවන් වුණා.

රුංරුං පැංචා නූල් කටින යන්තරයෙන් නූල් ඇඹරුවා. බක බක අප්පුහාමි ළිඳෙන් වතුර ගෙනැවිත් වත්තේ එළවුළු කොටුවට දැම්මා. ඉදිකටු මුදියන්සෙ කැලේට ගිහිල්ලා පලතුරු සහ දර කඩා ගෙන ඒවා තනි රෝදෙ අත් කරත්තෙ පටවා ගෙන ආවා. හඬලන රාල එයාගෙ මෝලෙ පිටි අඹරන්ට පටන් ගත්තා.

යාළුවො හතර දෙනාගෙ සැපදුක් දැනගන්න දවසක් පිනුම් හාමි ඒ ගොල්ලන්ගෙ ගෙදරට ආවා. යාළුවො හතර දෙනා පිනුම් හාමි දැකලා බොහොම සන්තෝස වුණා. රුංරුං පැංචා පිනුම් හාමිට අත් මේස් කුට්ටමක් ගොතලා දුන්නා. බක බක අප්පුහාමි ලොකු කැරට් අලයක් දුන්නා. ඉදිකටු මුදියන්සෙ ඇපල් ගෙඩියක් දුන්නා. හඬලන රාල රස කැවිලියි පාන් ගෙඩියකුයි දුන්නා.

එදා රෝද ගෙනියන කොට හිනා වෙච්ච නිසා පිනුම් හාමිට ලජ්ජා හිතුණා. ''මට සමාවෙන්න. රෝද එකට එක ගැළපෙන ඒවා නොවුණත්, ඒවා පාවිච්චි කරන හැටි දන්න අය ඉන්නවා නම් වැඩ ගන්න පුළුවන් විත්තිය දැන් මට පේනවා'' කියලා පිනුම් හාමි කිව්වා.

1. පිට්ටනියේ තිබුණේ කුමක් ද ?
   (බයිසිකලයක්/පුංචි කරත්තයක්/සරුංගලයක්)

2. කරත්තයට සවි කර තිබුණේ
   (ගැළපෙන රෝදයි/බයිසිකල් රෝදයි/නොගැළපෙන රෝදයි)

3. අත් කරත්තය සෑදුවේ
   (රුං රුං පැංචා/බක බක අප්පුහාමි/ඉදිකටු මුදියන්සේ)

4. හක්ෂලන රාල පිනුම් හාමිට දුන්නේ
   (කැරට් අලයක්/ඇපල් ගෙඩියක්/රස කැවිලි සහ පාන් ගෙඩියක්)

5. මෙම කතාවේ යහළුවෝ හතර දෙනා
   (උත්සාහවන්ත යි/කම්මැළි යි/අකීකරු යි)

- කතන්දරය ඇසුරෙන් පිළිතුර ලියන්න.

1. කතාවේ සඳහන් යහළුවෝ හතර දෙනා කවුද ?

.............................................................................................................

.............................................................................................................

2. කරත්තය තල්ලු කිරීමට අපහසු වූයේ ඇයි ?

.............................................................................................................

3. නාගෙන එන්නේ කවරෙක් ද ?

...........................................................................................................................................

4. රෑං රුං පැංචා ගෙන ආ රෝදයෙන් සෑදුවේ කුමක් ද ?

...........................................................................................................................................

<u>සංවාද.</u>

- පහත සඳහන් සංවාදය කියවා පිළිතුරු ලියන්න.

## අපි හොඳ යාළුවෝ

අඹගස : තාරක පුතා මොකද අද පාඩම් කරන්න එන්න පරක්කු වුණේ ? මම මේ මඟ බල බලා සිටියේ.

තාරක : ගුරුතුමී ගෙදර වැඩට ගණන් ටිකක් දුන්නා. මම ගණන් ටික හදලා ආවේ.
අඹගස : අදත් පුතා ආවේ පාඩම් කරන්න නේ ද ?

තාරක : ඔව් ඔව් අද මම කියවීම් පොත අරගෙන ආවේ. 'ගස්වැල් සුමිතුරෝ' කියන කවි පාඩම් කරන්න.

අඹගස : ඒක හොඳයි. මම ගැන කියන තොරතුරුත් තියෙනව ද ? කියන්නකෝ බලන්න ලස්සනට.

තාරක : කෝ අද ගිරා යාළුවා. වෙනදට නම් මෙතනට ඇවිල්ලා.

ගිරවා : ඉන්නවා. ඉන්නවා . . . මම මේ අඹ අත්ත උඩ. ඔයාලා දෙන්නගේ කතාව මට ඇහුණා.

තාරක : එහෙනම් දෙන්නම දැන් අහගෙන ඉන්න. මම කවි කියනවා.

බලන බලන හැම තැනක ම
කොළ පාටින් ගස් ගොඩයි
ගස් සෙවණේ සිටින විට දි
ගස්වැල් මිතුරන් වගෙයි

පුංචි පුංචි ගස් ලොකු වී
දළු මල් පල හටගනියි
ඒ මල් පල සැමට ම දී
මිතුදම තව වැඩි කරයි

ගිරවා : හරි ම ලස්සනයි. ගස් ගැන කවි ඇහෙන කොටත් සතුටු යි.

අඹගස : ඔව්. ඔව්. තාරක පුතා ලස්සනට කවි කිවුවා.

ගිරවා : තාරක පුතා අද අඹ කෑවෙත් නැහැ නේද ?

තාරක : තව ම කෑවේ නැහැ. ඔයාලත් එක්ක කතා කරන එක ඊට වඩා සතුටු යි.

ගිරවා : මම අඹ කඩල දෙන්න ද?

අඹගස : ඔව් ගිරා යාළුවේ. තාරක පුතාට අඹ කඩලා දෙන්න.

තාරක : නංගිටයි, මල්ලිටයි, මටයි ගෙඩි තුනක් තිබුණා ම ඇති.

අඹගස : තාරක පුතා හරි ම හොඳයි. හැම දා ම නංගිටයි, මල්ලිටයි අඹ ගෙනියනවා.

තාරක : ස්තුති යි ගිරා යාළුවේ. මට අඹ දුන්නට අඹගසටත් බොහෝ ම ස්තුති යි.

අඹගස : තාරක පුතා පරිස්සමින් ගෙදර යන්න. හෙටත් පාඩම් කරන්න එන්න.

ගිරවා : ඔව් හෙටත් එන්න. අපි දෙන්න ම බලාගෙන ඉන්නවා.

1. මෙම සංවාදයෙහි සිටින අය කවුරු ද ?

   ..........................................................................................................................................

2. තාරක අඹ ගස ළඟට එන්නේ කුමකට ද ?

   ..........................................................................................................................................

3. අඹ කැඩුවේ කවුද ?

   ..........................................................................................................................................

4. සංවාදය කියවා හිස්තැන් පුරවන්න.

   ජම්බු ගස : කවීෂ පුතා, ඇයි අද අහක බලාගෙන යන්නේ ?

   කවීෂ : ..........................................................................................................................

   ජම්බු ගස : මේ දවස්වල ජම්බු ගහේ ගෙඩි පිරිලා

   කවීෂ : ..........................................................................................................................

   ජම්බු ගස : පුතා ආසාවෙන් ජම්බු කනවා. ඒක දකින කොට මට ගොඩක් සතුටු යි.

   කවීෂ : .........................................................................................................................

## චරිතාරොප්ති ව කතා කිරීම.

- කියවීම් පොතේ ඇතුළත් හරි පුදුමයි පාඩම සහකියවීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් කියවන්න. (සහකියවීමේ ක්‍රමවේදය යනු ගුරුවරයා නිවැරදි ව සහ හැඟීම් ප්‍රකාශ වන පරිදි ශබ්ද නඟා කියවන අතරතුර දී සිසුන් ඒ සමඟ මුමුණමින් කියවීම යි.) පහත මාතෘකා අතරින් කැමති මාතෘකා දෙකක් තෝරාගෙන මාතෘකාවට අදාළ රූපය ඇඳ තමා එම චරිතය යැයි සිතා ඒ පිළිබඳ වාක්‍ය තුනක් ලියන්න. (ගිරවා, මොනරා, මාළුවා, අලියා, සමනලයා)

.........................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

.....................................................................

................................................................................................................................................................

................................................................................................................................................................

................................................................................................................................................................

................................................................................................................................................................

.....................................................................

................................................................................................................................................................

................................................................................................................................................................


................................................................................................................................................................


................................................................................................................................................................

## <u>චිත්‍ර කතා</u>

- පහත දැක්වෙන චිත්‍ර කතාව කියවා අනෙක් චිත්‍ර කතාවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.









- සංවාදය සම්පූර්ණ කරන්න.



මල :- පිච්චෙන්න අව්ව සැරයි.
ගෙඩිය :- ඔබේ ලස්සන අඩුවෙයි ද?
මල :- මගේ ලස්සන අඩුවෙන කොට ඔබටයි අවාසි.
ගෙඩිය :- ඇයි ඒ?
මල :- මම නිසානෙ ඔබ හැදෙන්නේ.

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

# පිළිතුරු



Answer

# 3 ශ්‍රේණිය මව්බස (සිංහල)
# $L_3$ $S_3$ $R_3$ $W_3$ ඉගෙනුම් පල

- කැමැත්තෙන් හා රස විඳිමින් සවන් දෙයි.
- කැමැත්තෙන් හා රස විඳිමින් කතා කරයි.
- කැමැත්තෙන් හා රස විඳිමින් කියවයි.
- කැමැත්තෙන් හා රස විඳිමින් ලියයි/අඳියි

## ළමා කවි/ගීත.

- පහත සඳහන් ගීතය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

**මගේ රට**

පුංචි අපට සිරි සැප දෙයි
සිරි ලංකා දීපේ
පාන්දර ම එහෙන් මෙහෙන්
ඇසෙයි කුරුලු ගීතේ
ඕලු නෙළුම් පිපී වැනෙයි
පිරිලා වැව් ගානේ
ඇළ දොළ ගං ඉවුරු දිගේ
වන මල් පෙති පාවේ
සුදු වැල්ලේ කවඩි උඩින්
රළ පෙරළෙයි මූදේ
උසට උසේ කඳු ද පෙනේ
වලාකුළු ද ගෑවේ

පිපෙන සමන් පිච්ච පොකුරු
නැළවෙයි හඳපානේ
ඉර එළියට හඳ එළියට
වෙලේ ගොයම් නෑවේ
වනන්තරේ ගස් බිල්වල
මී පැණි බිඳු බේරේ
හරි සුවඳයි පැසෙයි ඉදෙයි
පලතුරු හැම වාරේ
පුංචි අපට සිරි සැප දෙයි
සිරි ලංකා දීපේ

ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ

1. පාන්දර ම ඇසෙන්නේ මොනවා ද ?
..........කුරුලු ගීත..........
2. ඇළ දොළ ගංගාවල පාවෙන්නේ මොනවා ද ?
..........වන මල් පෙති..........
3. වලාකුළු ගෑවෙන්නේ කොහේ ද ?
..........කඳු වල..........
4. හඳපානේ නැළවෙන්නේ මොනවා ද ?
..........පිපෙන සමන් පිච්ච පොකුරු..........
5. මෙම ගීතයෙන් කියවෙන්නේ කුමක් පිළිබඳ ව ද ?
..........සිරි ලංකා දීපේ සුන්දරත්වය ගැන..........
6. ගීතය කියවා හිස්තැන් සම්පූර්ණ කරන්න.

- ඕලු නෙළුම් පිපී වැනෙයි ..........පිරිලා වැව් ගානේ..........
- උසට උසේ කඳු ද පෙනේ ..........වලාකුළු ද ගෑවේ..........
- පිපෙන ..........සමන් පිච්ච.......... පොකුරු නැළවෙයි හඳපානේ
- වනන්තරේ ගස් බිල්වල ..........මී පැණි බිඳු බේරේ..........
- පුංචි අපට සිරි සැප දෙයි ..........සිරි ලංකා දීපේ..........

- A 4 කොළයක් සහ පාට පෙට්ටියක් බැගින් සිසුන්ට ලබා දෙන්න. මගේ රට ගීතය ඇසුරින් චිත්‍රයක් ඇඳීමට උපදෙස් දෙන්න. තමා අඳින ලද චිත්‍රයට ගැළපෙන වාක්‍ය තුනක් අභ්‍යාස පොත්වල ලිවීමට සලස්වන්න.

<u>**කතන්දර.**</u>

- කියවීම් පොතේ ඇතුළත් නොගැළපෙන රෝද කතන්දරය කියවා වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

**නොගැළපෙන රෝද**

මැස්සෙකුයි, ගෙම්බෙකුයි, ඉත්තෑවෙකුයි, කුකුළෙකුයි ගස් කොටයක් උඩ ගෙයක් හදාගෙන උන්නා. මැස්සගෙ නම රුංරුං පැංචා. ගෙම්බගෙ නම බක බක අප්පුහාමි. ඉත්තෑවගෙ නම ඉඳිකටු මුදියන්සෙ. කුකුළාගෙ නම හඬලන රාල.

දවසක් දා මේ හතර දෙනා කැලෑවක් මැදින් ගමනක් ගියා. හතු, මල්, ගෙඩි ජාති, දර එකතු කරන්න. රුං රුං පැංචා යාළුවො තුන් දෙනාගෙ ඔළු උඩින් පියාසර කෙරුවා.

ඉතින් ඔහොම ගිහින්, ගිහින් මේ හතර දෙනා ම ගස් කොළන් නැති පාළු පිට්ටනියකට ආවා. එතන පුංචි කරත්තයක් තිබෙනවා දැක්කා. කරත්තෙට සවි කරල තිබුණෙ එකට එක නොගැළපෙන රෝද. පළමුවැනි රෝදෙ බොහොම කුඩා එකක්. දෙවැනි රෝදෙ තරමක් ලොකු යි. තුන්වැනි රෝදෙ ඊට ලොකු යි. හතරවැනි රෝදෙ මහ විශාල යි.

යාළුවො පුදුම වෙලා කරත්තෙ දිහා බලාගෙන ඉන්නකොට, ළඟ තිබුණ පඳුරකින් හාවෙක් එළියට පැන්නා. එයත් කරත්තෙ දිහා බලලා හිනා වෙනවා. හාවාගෙ නම පිනුම් හාමි.

''මේ කරත්තෙ ඔයාගෙ ද?'' කියල යාළුවො හතර දෙනා පිනුම් හාමිගෙන් ඇහුවා.''නෑ. ඒක වලස් හාමිගෙ කරත්තෙ. වලස් හාමි ඔය කරත්තෙ හදන්න බොහොම මහන්සි ගත්තා. ඒත් එයාට ඒක හදල ඉවර කරන්ට බැරි වුණා'' කියල පිනුම් හාමි කිව්වා.

''මේ කරත්තෙන් වැඩක් ගන්ට පුළුවන්. ඒ හින්ද අපි මේක ගෙදර ගෙනියමු'' කියලා ඉත්තෑහාමි කිව්වා. ''හොඳයි, හොඳයි'' කියලා ඒ අදහසට අනිත් යාළුවො තුන් දෙනා ම කැමති වුණා. ඒ හතර දෙනා ම එකතු වෙලා කරත්තෙ තල්ලු කරන්න පටන් ගත්තා. රෝද එකට එක ගැළපෙන්නෙ නැති හින්ද කරත්තෙ පොඩ්ඩක් වත් හෙල්ලුණෙ' නෑ. තල්ලු කළාට මොකද පාර පුරා ගස් මුල්වල හැපිලා කරත්තෙ ඒ අත මේ අත පෙරළුණා මිසක් ඉදිරියට ගියේ නෑ.

අහකට වෙලා බලාගෙන හිටිය පිනුම් හාමි හති වැටෙන තුරු හිනා වුණා. කරත්තෙ තල්ලු කරපු යාළුවො හතර දෙනාට හොඳට ම මහන්සියි. ''අපි එක එක්කෙනා එක එක රෝදය ගෙදර ගෙනියමු'' කියලා ඉඳිකටු මුදියන්සෙ කිව්වා.

හතර දෙනා ම ඊකට කැමති වෙලා එක එක රෝදය ගත්තා. රුංරුං පැංචා ඉතා ම කුඩා රෝදය පෙරළන්ට පටන් ගත්තා. ඉඳිකටු මුදියන්සෙ ඊළඟ රෝදය පෙරළන්න පටන් ගත්තා. බක බක අප්පුහාමි තරමක් විශාල රෝදය පෙරලන්න පටන් ගත්තා. හඬලන රාල විශාල රෝදය පෙරළා ගෙන ගෙදර ගියා.

''මේ ගොල්ලො හරි පුදුම මිනිස්සු. එකට එක ගැළපෙන්නෙ නැති රෝද ගෙදර ගෙනියනවා'' කියලා පිනුම් හාමි කිව්වා. ඊට පස්සෙ පිනුම් හාමි පඳුරු අස්සට පැනලා ගියා.

රුංරුං පැංචයි, ඉඳිකටු මුදියන්සෙයි, බක බක අප්පුහාමියි, හඬලන රාලයි රෝද හතර ගෙදර ගෙනාවා. රෝදවලින් වැඩක් ගන්නේ කොහොම දැයි කියලා හතර දෙනා ම කල්පනා කරන්න පටන් ගත්තා.

''මම දන්නවා වැඩක් ගන්න හැටි'' කියලා රුංරුං පැංචා කිවුවා. එයා ඉතා ම කුඩා රෝදයෙන් නූල් කටින යන්තරයක් හදා ගත්තා. ඉදිකටු මුදියන්සෙ එයා ගෙනා රෝදයට ලී පටි දෙකක් සවි කරගෙන තනි රෝදෙ අත් කරත්තයක් හදා ගත්තා.

''මටත් පුළුවනි මගේ රෝදයෙන් වැඩක් ගන්න'' කියලා බක බක අප්පුහාමි කිවුවා. රෝදය ළිඳට උඩින් සවි කරලා බක බක අප්පුහාමි ලෙහෙසියෙන් වතුර අදින්න පටන් ගත්තා.

වේගයෙන් ගලා යන දිය පාරකට අහු වෙලා කැරකැවෙන්න රෝදය සවි කර ගත්තු හඬලන රාලට පුළුවන් වුණා ජල බලයෙන් වැඩ කරන මෝලක් හදා ගන්ට.

මේ විදියට සියලු ම රෝදවලින් වැඩ ගන්න පුළුවන් වුණා.

රුංරුං පැංචා නූල් කටින යන්තරයෙන් නූල් ඇඹරුවා. බක බක අප්පුහාමි ළිඳෙන් වතුර ගෙනැවිත් වත්තේ එළවුළු කොටුවට දැම්මා. ඉදිකටු මුදියන්සෙ කැලේට ගිහිල්ලා පලතුරු සහ දර කඩා ගෙන ඒවා තනි රෝදෙ අත් කරත්තෙ පටවා ගෙන ආවා. හඬලන රාල එයාගෙ මෝලෙ පිටි අඹරන්ට පටන් ගත්තා.

යාළුවො හතර දෙනාගෙ සැපදුක් දැනගන්න දවසක් පිනුම් හාමි ඒ ගොල්ලන්ගෙ ගෙදරට ආවා. යාළුවො හතර දෙනා පිනුම් හාමි දැකලා බොහොම සන්තෝස වුණා. රුංරුං පැංචා පිනුම් හාමිට අත් මේස් කුට්ටමක් ගොතලා දුන්නා. බක බක අප්පුහාමි ලොකු කැරට් අලයක් දුන්නා. ඉදිකටු මුදියන්සෙ ඇපල් ගෙඩියක් දුන්නා. හඬලන රාල රස කැවිලියි පාන් ගෙඩියකුයි දුන්නා.

එදා රෝද ගෙනියන කොට හිනා වෙච්ච නිසා පිනුම් හාමිට ලජ්ජා හිතුණා. ''මට සමාවෙන්න. රෝද එකට එක ගැළපෙන ඒවා නොවුණත්, ඒවා පාවිච්චි කරන හැටි දන්න අය ඉන්නවා නම් වැඩ ගන්න පුළුවන් විත්තිය දැන් මට පේනවා'' කියලා පිනුම් හාමි කිව්වා.

1. පිට්ටනියේ තිබුණේ කුමක් ද ?
   (බයිසිකලයක්/පුංචි කරත්තයක්/සරුංගලයක්)

2. කරත්තයට සවි කර තිබුණේ
   (ගැළපෙන රෝදයි/බයිසිකල් රෝදයි/නොගැළපෙන රෝදයි)

3. අත් කරත්තය සෑදුවේ
   (රුං රුං පැංචා/බක බක අප්පුහාමි/ඉදිකටු මුදියන්සේ)

4. හඬලන රාල පිනුම් හාමිට දුන්නේ
   (කැරට් අලයක්/ඇපල් ගෙඩියක්/රස කැවිලි සහ පාන් ගෙඩියක්)

5. මෙම කතාවේ යහළුවෝ හතර දෙනා
   (උත්සාහවන්ත යි/කම්මැළි යි/අකීකරු යි)

- කතන්දරය ඇසුරෙන් පිළිතුරු ලියන්න.

1. කතාවේ සඳහන් යහළුවෝ හතර දෙනා කවුද ?

මැස්සා, ගෙම්බා, ඉත්තෑවා, කුකුළා (රුංරුං පැංචා, බක බක අප්පුහාමි, ඉදිකටු මුදියන්සෙ, හඬලන රාල).

2. කරත්තය තල්ලු කිරීමට අපහසු වූයේ ඇයි ?

රෝද එකට එක ගැළපෙන්නෙ නැති හින්දා

3. ළිඳෙන් වතුර ගෙනැවිත් වත්තේ එළවුළු කොටුවට දැම්මේ කවු ද ?

බක බක අප්පුහාමි

4. රූං රුං පැංචා ගෙන ආ රෝදයෙන් සෑදුවේ කුමක් ද ?

නූල් කටින යන්තරයක් හදා ගත්තා.

## සංවාද.

- පහත සඳහන් සංවාදය කියවා පිළිතුරු ලියන්න.

### අපි හොඳ යාළුවෝ

අඹගස : තාරක පුතා මොකද අද පාඩම් කරන්න එන්න පරක්කු වුණේ ? මම මේ මඟ බල බලා සිටියේ.

තාරක : ගුරුතුමී ගෙදර වැඩට ගණන් ටිකක් දුන්නා. මම ගණන් ටික හදලා ආවේ.

අඹගස : අදත් පුතා ආවේ පාඩම් කරන්න නේ ද ?

තාරක : ඔව් ඔව් අද මම කියවීම් පොත අරගෙන ආවේ. 'ගස්වැල් සුමිතුරෝ' කියන කවි පාඩම් කරන්න.

අඹගස : ඒක හොඳයි. මම ගැන කියන තොරතුරුත් තියෙනව ද ? කියන්නකෝ බලන්න ලස්සනට.

තාරක : කෝ අද ගිරා යාළුවා. වෙනදට නම් මෙතනට ඇවිල්ලා.

ගිරවා : ඉන්නවා. ඉන්නවා . . . මම මේ අඹ අත්ත උඩ. ඔයාලා දෙන්නගේ කතාව මට ඇහුණා.

තාරක : එහෙනම් දෙන්නම දැන් අහගෙන ඉන්න. මම කවි කියනවා.

බලන බලන හැම තැනක ම
කොළ පාටින් ගස් ගොඩයි
ගස් සෙවණේ සිටින විට දී
ගස්වැල් මිතුරන් වගෙයි

පුංචි පුංචි ගස් ලොකු වී
දළු මල් පල හටගනියි
ඒ මල් පල සැමට ම දී
මිතුදම තව වැඩි කරයි

ගිරවා : හරි ම ලස්සනයි. ගස් ගැන කවි ඇහෙන කොටත් සතුටු යි.

අඹගස : ඔව්. ඔව්. තාරක පුතා ලස්සනට කවි කිවුවා.

ගිරවා : තාරක පුතා අද අඹ කෑවෙත් නැහැ නේද ?

තාරක : තව ම කෑවේ නැහැ. ඔයාලත් එක්ක කතා කරන එක ඊට වඩා සතුටු යි.

ගිරවා : මම අඹ කඩල දෙන්න ද?

අඹගස : ඔව් ගිරා යාළුවේ. තාරක පුතාට අඹ කඩලා දෙන්න.

තාරක : නංගිටයි, මල්ලිටයි, මටයි ගෙඩි තුනක් තිබුණා ම ඇති.

අඹගස : තාරක පුතා හරි ම හොඳයි. හැම දා ම නංගිටයි, මල්ලිටයි අඹ ගෙනියනවා.

තාරක : ස්තුති යි ගිරා යාළුවේ. මට අඹ දුන්නට අඹගසටත් බොහෝ ම ස්තුති යි.

අඹගස : තාරක පුතා පරිස්සමින් ගෙදර යන්න. හෙටත් පාඩම් කරන්න එන්න.

ගිරවා : ඔව් හෙටත් එන්න. අපි දෙන්න ම බලාගෙන ඉන්නවා.

1. මෙම සංවාදයෙහි සිටින අය කවුරු ද ?

   ...තාරක, ගිරවා, අඹගස...

2. තාරක අඹ ගස ළඟට එන්නේ කුමකට ද ?

   ...පාඩම් කරන්න...

3. අඹ කැඩුවේ කවුද ?

   ...ගිරවා...

4. සංවාදය කියවා හිස්තැන් පුරවන්න.

   ජම්බු ගස : කවීෂ පුතා, ඇයි අද අහක බලාගෙන යන්නේ ?

   කවීෂ : ...මට අද ගෙදර වැඩ ගොඩක් තියෙනවා...

   ජම්බු ගස : මේ දවස්වල ජම්බු ගහේ ගෙඩි පිරිලා

   කවීෂ : ...එහෙනම් මම ටිකක් කඩා ගෙන කන්නම්...

   ජම්බු ගස : පුතා ආසාවෙන් ජම්බු කනවා. ඒක දකින කොට මට ගොඩක් සතුටු යි.

   කවීෂ : ...ස්තුති යි යාළුවේ. මම හෙටත් එන්නම්...

**<u>චරිතාරෝපිත ව කතා කිරීම.</u>**

- කියවීම් පොතේ ඇතුළත් හරි පුදුමයි පාඩම සහකියවීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් කියවන්න. (සහකියවීමේ ක්‍රමවේදය යනු ගුරුවරයා නිවැරදි ව සහ හැඟීම් ප්‍රකාශ වන පරිදි ශබ්ද නඟා කියවන අතරතුර දී සිසුන් ඒ සමඟ මුමුණමින් කියවීම යි.) පහත මාතෘකා අතරින් කැමති මාතෘකා දෙකක් තෝරාගෙන මාතෘකාවට අදාළ රූපය ඇඳ තමා එම චරිතය යැයි සිතා ඒ පිළිබඳ වාක්‍ය තුනක් ලියන්න. (ගිරවා, මොනරා, මාළුවා, අලියා, සමනලයා)

...ගිරවා...



✓ ...මම ඉතා අලංකාර මාල ගිරවෙක් වෙමි...

✓ ...මම අඹ කෑමට ඉතා කැමැත්තෙමි...

✓ ...මම පියාසර කරන අතරතුර සුන්දර ස්ථාන දැක බලා ගන්නෙමි...

## මාළුවා



✓ මම ගැඹුරු මුහුදේ ජීවත් වන මාළුවෙක් වෙමි.

✓ මම මුහුදු පතුලේ ඇති ජලජ ශාක කෑමට ඉතා කැමැත්තෙමි.

✓ මම ගැඹුරු මුහුදේ පීනන අතරතුර සුන්දර ස්ථාන දැක බලා ගන්නෙමි.

## සමනලයා




✓ මම මල් වත්තක ජීවත් වන අලංකාර සමනලයෙක් වෙමි.


✓ මම මල් පැණි බීමට ඉතා කැමැත්තෙමි.


✓ මම මලින් මලට පියාඹන අතරතුර සුන්දර ස්ථාන දැක බලා ගන්නෙමි.


### <u>චිත්‍ර කතා</u>


- පහත දැක්වෙන චිත්‍ර කතාව කියවා අනෙක් චිත්‍ර කතාවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.











- සංවාදය සම්පූර්ණ කරන්න.



මල :- පිච්චෙන්න අව්ව සැරයි.
ගෙඩිය :- ඔබේ ලස්සන අඩුවෙයි ද?
මල :- මගේ ලස්සන අඩුවෙන කොට ඔබටයි අවාසි.
ගෙඩිය :- ඇයි ඒ?
මල :- මම නිසානෙ ඔබ හැදෙන්නේ.

ගෙඩිය : ඒ කොහොම ද?
මල : අපි පරාගනය වුණාම තමයි ගෙඩියක් වෙන්නේ.
ගෙඩිය : අනේ ඇත්ත ද? මම අද තමයි දැන ගත්තේ.
මල : ඔව් අපි ගෙඩියක් වෙනකොට ලස්සන මල් පෙති ටික කොහොමත් පරවෙලා යනවා. අව්වට පිච්චුනාට, අපේ කොළ වලට කෑම හදන්න උදව් කරන්නෙත් එයා.
ගෙඩිය : ස්තුති යි යාළුවේ. නොදන්න දේවල් කියලා දුන්නාට.

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප **3in1 Youtube** නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

**ස්තූතියි !**

# හසිත හෙට්ටිආරච්චි

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



**3 in 1 youtube** නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ